62

<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම -2026</u>

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන), අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සත්ත්ව සෞඛ්‍ය), අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පශු පර්යේෂණ) හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පශු සම්පත් සංවර්ධන) තනතුරු 04 ක් සඳහා පවතින පුරප්පාඩු පිරවීමට අදාළව නිලධාරීන් උසස් කිරීම සඳහා අංක 1840/51 හා 2013.12.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ සක්‍රිය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. වැටුප් පරිමාණය**

2025.03.25 දින අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.156,000 – 12 × 4,850 – 214,200 (SL-3-2025) වේ.

**03. සපුරාලිය යුතු සුදුසුකම්**

03.1 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වසර 18ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) උපයාගෙන තිබීම.

03.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පැවතීම.

03.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

03.5 අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාළ පුහුණු අවශ්‍යතා සපුරා තිබීම.

04. මෙම තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් උසස් කිරීමට අදාළව මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව අයදුම්පත් කැඳවන අතර, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එම අයදුම්පත් හා අදාළ ලිපි ලේඛන ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන **2026.07.10** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාරදීමට හෝ කටයුතු කළ යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම - 2026 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

05. ලැබෙන අයදුම්පත් අනුව සුදුසුකම් සපුරා ඇති <u>සක්‍රිය සේවයේ නියුතු අයදුම්කරුවන් පමණක්</u> ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට එහි ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබා ගනු ලබන නිලධාරීන් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව <u>සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u> රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

06. මෙම උසස් කිරීමට අදාළ ලකුණු පටිපාටිය පහත පරිදි වේ.

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨතාවය ලකුණු 40 | I වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලය ඉක්මවා ඇති වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවයට හිමි ඉහළම ලකුණු ප්‍රමාණය ලබා දෙන අතර සෙසු නිලධාරීන්ට පහත ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු ගණන X 12 + මාස ) X අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු ගණන X 12 + මාස ) |
| 02 | කුසලතාවය ලකුණු 60 | **2.1 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා - උපරිම ලකුණු 10**<br>( සැ.යු. : සේවා කාලය තනතුරට පත් කිරීමේ විධිමත් පත් කිරීම් ලිපි මඟින් සනාථ කළ යුතු ය).<br><br>I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / I ශ්‍රේණියේ තනතුරක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු ගණන X 12 + මාස) X අදාළ නිලධාරියාගේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය (අවුරුදු ගණන X 12 + මාස)<br><br>**2.2 වෘත්තීය ක්‍රියාකාරකම් (ඉදිරිපත් කිරීම) - උපරිම ලකුණු 20**<br>• අන්තර්ගතය තුළ ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය - ලකුණු 08<br>• පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාර - ලකුණු 05<br>• ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමනාකරණය - ලකුණු 04<br>• සැකසුම හා නිර්මාණශීලීත්වය - ලකුණු 03<br><br>(නිලධාරියා විසින් පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට ඉටු කරන ලද රාජකාරි කටයුතු සම්බන්ධයෙන් පරිගණක ආශ්‍රයෙන් කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් බලාපොරොත්තු වේ. එය අදාළ කාලසීමාවට සරිලන ලෙස ස්ව අභිමතය පරිදි තෝරාගත හැකිය. නිලධාරියා විසින් ක්ෂේත්‍රයේ උන්නතියට ඉටු කරන ලද රාජකාරි සනාථ කිරීම සඳහා වන ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය).<br><br>**2.3 වෙනත් සුදුසුකම් - උපරිම ලකුණු 25**<br>• ජාත්‍යන්තර වශයෙන් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ සඳහා - ලකුණු 10 බැගින්<br>• ජාතික මට්ටමින් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ සඳහා - ලකුණු 07 බැගින්<br>• පළාත් මට්ටමින් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ සඳහා - ලකුණු 05 බැගින්<br>• ප්‍රශංසා සහතික (පොදු 230බී ආකෘතියෙන්) සඳහා - ලකුණු 03 බැගින්<br>• ජාත්‍යන්තරව පළ කරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන සඳහා (International Research Publication) - ලකුණු 10 බැගින්<br><br>✓ Full Paper in peer reviewed journals, Book Chapter - ලකුණු 10<br>✓ Extended Abstract - ලකුණු 07<br>✓ Abstract - ලකුණු 05 |

<table>
<tr><td></td><td></td><td>
<ul><li>දේශීයව පළ කරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන සඳහා (Local Research Publication) - ලකුණු 07 බැගින්</li></ul>
✓ Full Paper in peer reviewed journals, Book Chapter - ලකුණු 07<br>
✓ Extended Abstract - ලකුණු 05<br>
✓ Abstract - ලකුණු 03<br><br>
(මෙහිදී නිලධාරියාගේ සෘජු දායකත්වය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සනාථ කළයුතු අතර, උපරිම අවස්ථා 05ක් සඳහා උපරිම ලකුණු 25 ක් ලබා දෙනු ලැබේ. ඉහත සියලු වෙනත් සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර සපුරා තිබීම අත්‍යවශ්‍ය වේ. ප්‍රශංසා සහතික සඳහා ලකුණු ලබාදීම සළකා බලනුයේ අදාළ ප්‍රශංසා සහතිකය පෞද්ගලික ලිපි ගොනුවට පොදු 230 බී ආකෘතියෙන් ඇතුලත්කර තිබේ නම් පමණි. )<br><br>
2.4 සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුනතාවය - උපරිම ලකුණු 05
<ul>
<li>පෙන්නුම් කරන ලද නායකත්ව කුසලතා සඳහා - ලකුණු 02</li>
<li>භාෂා හැකියාව සඳහා - ලකුණු 02</li>
<li>සන්නිවේදන කුසලතා සඳහා - ලකුණු 01</li>
</ul>
</td></tr>
<tr><td colspan="3">මුළු ලකුණු 100</td></tr>
</table>

07. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම් කිරීමට අපේක්ෂිත නිලධාරීන් මෙ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය සමග අනෙකුත් ලේඛනවල විධිමත් පරිදි තමා විසින්ම සහතික කරන ලද පිටපත් ඇතුලත් ගොණුවක් ද යොමු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඒ.යූ.කේ. දොඩන්වල**
ලේකම් (වැ.බ)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය